**උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගත් උපාධිධාරීන් නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම- 2022**

නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීම සඳහා වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි සහ සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ පහත සඳහන් වර්ෂවල උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගත් නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උපලේඛණ 01හි දක්වා ඇති විෂයන් සඳහා දීප ව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් යොමු කළ හැකි අතර නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එකී අයදුම්කරුවන්ද සලකා බලනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2022.03.31** දින වේ. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනක, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**01. යෝග්‍යතා ඃ-**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

1.1.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2 යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

1.1.3 2019.12.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

**සටහන**
**"2020 උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන" යටතේ බඳවාගත් අභ්‍යාසලාභීන්ගේ, 2020.01.01 දින සිට සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයට බඳවාගත් උපාධිධාරීන්ගේ 2019.12.31 දිනට වයස අවුරුදු 35ට අඩු සේ සලකනු ලැබේ.**

1.1.4 අයදුම්කරුවන් පහත සඳහන් කාණ්ඩයක් යටතේ මේ වන විටත් බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභියෙකු / සංවර්ධන නිලධාරියෙකු විය යුතුය.

(i) උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන - 2020 යටතේ බඳවා ගනු ලැබූ උපාධිධාරියෙකු වීම.

හෝ

(ii) 2018 සහ 2019 වසරවලදී ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම" වැඩසටහන යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගනුලැබ 2020.01.01 සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරියෙකු ලෙස ස්ථිර පත්වීමක් ලබා ඇති අයකු වීම.

හෝ

(iii) උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩ සටහන යටතේ 2018,2019 හා 2020 වසරවල බඳවා ගනු ලැබූ ඩිප්ලෝමාධාරියකු වීම.

සටහන - එක් එක් විෂය සඳහා උපාධීධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිනම් පමණක් එම පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් සලකා බලනු ලැබේ.

**1.2 අධ්‍යාපන සුදුසුකම්**

1.2.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමනු ලබන ඉල්ලුම් කරනු ලබන විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබා ගත් උපාධියක් තිබීම. **ඉල්ලුම්කරනු ලබන විෂයය උපාධි පාඨමාලාව තුළ ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති බවට වන ලිපියක් අදාළ විශ්ව විද්‍යාලය/ආයතනය වෙතින් ලබා ගෙන (විශ්ව විද්‍යාලයක් නම් ලේඛකාධිකාරී වෙතින් පමණක් ලබා ගත යුතුය) අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි ලිපියක් ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සහ**

1.2.2 අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

## 02. බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි ඃ-

2.1 මෙම දැන්වීමට අදාළව පුරප්පාඩු පවතින විෂයයන් සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මෙම බඳවා ගැනීමේ දැන්වීමට අදාළව සුදුසුකම් සනාථ කරනු ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.2 බඳවා ගැනීමේදී අයදුම්කරුවෙකුගේ නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය පළමුව සලකා බැලේ. එම දිස්ත්‍රික්කයේ පුරප්පාඩු සම්පූර්ණයෙන් පිරවීමෙන් පසු අයදුම්කරු විසින් ඉල්ලුම් කර ඇති විෂයය/විෂයයන්ට අදාලව වෙනත් දිස්ත්‍රික්කයන්හි පුරප්පාඩු පවතී නම් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති **'අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක'** යන කොටසෙහි සඳහන් දිස්ත්‍රික්කයන්ගේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පත්වීම් ලබාදීමට සලකා බලනු ලැබේ. පිට පළාත්වලින් අයදුම්කරන අපේක්ෂකයින්ට අයදුම්පත්‍රයෙහි සඳහන් **'අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක'** යන කොටසෙහි සඳහන් දිස්ත්‍රික්ක අනුපිළිවෙල අනුව පත්වීම් ලබාදීමට සලකා බලනු ලැබේ.

2.3 පුරප්පාඩු පවතින කලාප සහ විෂයයන් උපලේඛන අංක 02හි දැක්වේ.

2.4 අයදුම්කරනු ලබන විෂයය කිසිසේත්ම වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳවද සලකා බලනු නොලැබේ.

2.5 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ දිස්ත්‍රික් පදනම මත වන බැවින්, වසර 10 ක් ගත වනතුරු ස්ථාන මාරු සඳහා සලකා බලනු නොලැබේ. එසේම පත් කරනු ලබන පාසල තුළ වසර 10ක කාලයක් සේවය කළ යුතුය. එසේ වුවද සේවා අවශ්‍යතාවය මත මෙම කොන්දේසි වෙනස් කිරීමේ බලය නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා සතුවේ. මේ පිළිබඳව සේවා ගිවිසුමක් නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ඇති කර ගැනීමට එකඟ විය යුතුය.

2.6 මෙම පත්වීම් ලබා දෙනුයේ තාවකාලික පදනමින් වන අතර වසර තුනක් ඇතුළත ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1 අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයවලුන් සඳහා පමණක් නිත්‍ය ගුරු පත්වීම් ලබා දෙනු ලැබේ. තරග විභාගයෙන් අසමත් වන්නන් සඳහා වසරක් තුළ නැවත විභාගයක් පැවැත්වීම හෝ පෙරලා පෙර සිටි තනතුරට පත් කිරීමට හෝ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කිරීම හෝ සිදු කරනු ලැබේ. විභාගය අසමත් වන ඩිප්ලෝමාධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

2.7 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද, යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 03/2016 (IV) අනුව වන අතර මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය G.E.-1-2016 A දරණ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු. 31,490 - 445x6 - 525x7 - 600x2 රු. 39,035/- වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

2.8 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.9 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකඃ 1885/38, දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

2.10 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

3.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 10.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

3.2 අයදුම්පත්‍රය සමග පහත ලේඛන අමුණා එවිය යුතුය.

- ඉහත 1.1.4 හි සඳහන් යෝග්‍යතාවය සනාථ කිරීමට අදාල පත්වීම් ලිපියෙහි ඡායා පිටපත
- උපාධි සහතිකයේ ඡායා පිටපත
- විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි (Transcript) ඡායා පිටපත
- ඉහත 1.2.1 හි සඳහන් සහතිකය

3.3 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

3.4 උපලේඛන 02 යටතේ සඳහන් විෂයයන් සඳහා අවශ්‍ය වන අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර, ඔබගේ උපාධියට අදාල විෂයයන් සඳහා පමණක් අයදුම්පත් යොමු කළ යුතු වේ. විෂයයන් කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය. අයදුම්පත් වෙන වෙනම ලිපිකවරවල බහා එවිය යුතුය. එක් එක් විෂයයන් සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු නොකර තිබුණහොත් එවැනි අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.5 අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන ආයතනයේ/දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

3.6 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2022.03.31** වන දිනට හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.**(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංකඃ 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය.

3.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/22/02** යන්න සඳහන් කළ යුතුය.

**04. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම ඃ-**

නිසි පරිදි අයදුම්පත් ඉදිරිපත් කරන ලද මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන්ට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපියක් නිකුත් කරනු ඇත.

**05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අයදුම්කරු තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**06. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**07.** **ප්‍රායෝගික පරීක්ෂණය**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (i) අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| (ii) පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| (iii) සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| (iv) කාල කළමනාකරණය | 05 | 02 |
| (v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම | 05 | 02 |
| ***මුළු ලකුණු ප්‍රමාණය*** | ***25*** | ***10*** |

**08.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**09.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**10.** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතියද, යම් විශේෂ හේතුවක් මත සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට සිදුවුවහොත් ඒ පිළිබඳව අවසාන තීරණයද, කිසියම් පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හෝ මුළුමණින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳවද, උපාධියක වලංගුභාවය සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය ද, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි එහි ලේකම්වරයා සතු වේ.

එම්.ගෝපාලරෙත්තිනම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
ත්‍රිකුණාමලය.
2022.03.08

උපලේඛන 01

## Vacancies of Advanced Level in Eastern Province (Sinhala Medium)

| SubNo | Subject | Ampara | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | AMPARA | DEHIATTAKANDIYA | MAHAOAYA | KANTHALE | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 20 | Chemistry | - | ✓ | ✓ | - | - | - | - |
| 21 | Physics | ✓ | - | ✓ | ✓ | - | - | ✓ |
| 22 | Biology | - | - | ✓ | ✓ | - | - | ✓ |
| 29 | Information & Communication Technology (ICT) | - | - | ✓ | ✓ | - | ✓ | - |
| 24 | Combined Mathematics | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |

## Vacancies of Secondary in Eastern Province (Sinhala Medium)

| SubNo | Subject | Ampara | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | AMPARA | DEHIATTAKANDIYA | MAHAOAYA | KANTHALE | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 44 | Science | - | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |
| 45 | Maths | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 61 | Information & Communication Technology (ICT) | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |

උපලේඛන 02

## Vacancies of Advanced Level in Eastern Province (Sinhala Medium)

| SubNo | Subject | Ampara | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | AMPARA | DEHIATTAKANDIYA | MAHAOYA | KANTHALE | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 1 | Physical Education & Sports | - | - | - | - | - | ✓ | ✓ |
| 2 | Performing Arts | - | - | ✓ | - | - | - | ✓ |
| 3 | Fashion Designing | - | - | - | ✓ | - | - | - |
| 4 | Art & Designing | - | - | - | - | - | - | ✓ |
| 5 | Landscaping | - | ✓ | - | - | - | ✓ | - |
| 6 | Applied Horticulural Studies | - | - | - | ✓ | - | - | - |
| 7 | Livestock Product Studies | - | - | ✓ | - | - | - | - |
| 8 | Food Processing Studies | - | - | ✓ | - | - | - | - |
| 9 | Electrical and Electronic Studies | - | ✓ | - | - | - | - | ✓ |
| 10 | Aquatic Resource Studies | ✓ | - | - | - | - | - | - |
| 11 | Plantation Product Studies | ✓ | - | ✓ | | - | - | - |
| 12 | Construction Studies | - | - | | ✓ | - | - | - |
| 13 | Automobile Studies | ✓ | - | - | - | - | ✓ | - |
| 14 | Textile & Apparel Studies | ✓ | - | - | - | - | - | - |
| 15 | Aluminum Fabrication Studies | - | - | - | - | - | ✓ | - |
| 16 | Computer Hardware & Networking (Web Des & Software Development) | - | ✓ | - | ✓ | - | ✓ | ✓ |
| 17 | Tourism & Hospitality | - | - | - | - | - | - | ✓ |
| 18 | General Information Technology (GIT) | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 19 | English | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 20 | Chemistry | - | ✓ | ✓ | - | - | - | - |
| 21 | Physics | ✓ | - | ✓ | ✓ | - | - | ✓ |
| 22 | Biology | - | - | ✓ | ✓ | - | - | ✓ |
| 23 | Agriculture Science | ✓ | ✓ | ✓ | | - | - | ✓ |
| 24 | Combined Mathematics | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 25 | Engineering Technology | - | ✓ | ✓ | ✓ | - | ✓ | - |
| 26 | Bio-System Technology | - | - | - | - | - | - | ✓ |
| 27 | Science for Technology | - | ✓ | - | ✓ | - | ✓ | ✓ |
| 28 | Economics | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 29 | Information & Communication Technology (ICT) | - | - | ✓ | ✓ | - | ✓ | - |
| 30 | Geography | ✓ | ✓ | - | ✓ | - | ✓ | ✓ |
| 31 | Home Economy | ✓ | ✓ | - | - | - | - | - |
| 32 | Communication and Media Studies | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 33 | Business Studies | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 34 | Accounting | - | ✓ | - | - | - | - | - |
| 35 | Political Science | - | ✓ | - | ✓ | ✓ | ✓ | - |
| 36 | History (Indian/Europe/Modern World) | ✓ | - | ✓ | - | - | - | - |
| 37 | Agro Tech | ✓ | - | - | ✓ | - | - | - |
| 38 | Buddhist Civilization | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ |
| 39 | Dancing (Oriental) | - | - | ✓ | - | - | - | - |
| 40 | Drama & Theatre | - | - | ✓ | - | ✓ | - | ✓ |
| 41 | Sinhala (Language) | - | - | ✓ | - | - | - | ✓ |

# Vacancies of Secondary in Eastern Province (Sinhala Medium)

| SubNo | Subject | Ampara | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | AMPARA | DEHIATTAKANDIYA | MAHAOAYA | KANTHALE | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 42 | Guidance & Counselling | ✓ | ✓ | - | ✓ | - | ✓ | - |
| 43 | Special Education Unit | ✓ | ✓ | ✓ | - | - | - | - |
| 44 | Science | - | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |
| 45 | Maths | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 46 | Sinhala | ✓ | ✓ | - | ✓ | - | ✓ | ✓ |
| 47 | History | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 48 | Buddism | - | - | - | ✓ | ✓ | ✓ | ✓ |
| 49 | (Religion Subjects)Roman Catholic | - | - | - | - | - | ✓ | - |
| 50 | (Religion Subjects)Non Roman Catholic | - | - | - | - | - | ✓ | - |
| 51 | Geography | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 52 | Civic Education | ✓ | - | ✓ | ✓ | - | ✓ | ✓ |
| 53 | Business & Accounting Studies | - | ✓ | - | - | - | - | - |
| 54 | Entrepreneurship Education | ✓ | - | ✓ | ✓ | - | ✓ | ✓ |
| 55 | Second Language (Tamil) | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ |
| 56 | Music (Oriental) | ✓ | - | ✓ | ✓ | - | ✓ | ✓ |
| 57 | Art | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |
| 58 | Dancing (Oriental) | - | ✓ | - | - | - | - | - |
| 59 | Drama & Theatre | - | - | - | - | - | ✓ | - |
| 60 | Literature (Sinhala) | - | - | - | ✓ | - | - | - |
| 61 | Information & Communication Technology (ICT) | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 62 | Agriculture & Food Technology | - | ✓ | ✓ | - | - | - | - |
| 63 | Art & Crafts | - | - | ✓ | - | - | - | - |
| 64 | Communication & Media Studies | ✓ | - | ✓ | - | - | ✓ | - |
| 65 | Home Economics | - | ✓ | ✓ | - | - | - | - |
| 66 | Practical & Technical skills (PTS) | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ |
| 67 | Design & Construction Technology | - | - | ✓ | ✓ | - | - | ✓ |
| 68 | Health & Physical Education | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

# Vacancies of Advance Level in Eastern Province (Tamil Medium)

| | | Ampara | | | | Batticaloa | | | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **SubNo** | **Subject** | **AKKARAIPATTU** | **KALMUNAI** | **SAMMANTHURAI** | **THIRUKKOVIL** | **BATTICALOA** | **BATTICALOA CENTRAL** | **BATTICALOA WEST** | **KALKUDAH** | **PADDIRUPPU** | **KANTHALE** | **KINNIYA** | **MUTHUR** | **TRINCOMALEE** |
| 101 | Child Psychology & Care | - | ✓ | - | - | - | - | ✓ | - | - | - | - | ✓ | - |
| 102 | Health & Social Care | - | ✓ | - | - | - | - | - | ✓ | - | - | - | - | - |
| 103 | Physical Education & Sports | - | - | - | ✓ | - | ✓ | - | - | - | - | ✓ | - | - |
| 104 | Graphic Design | - | ✓ | ✓ | - | - | - | ✓ | - | - | - | ✓ | - | ✓ |
| 105 | Event Management | - | - | ✓ | - | - | - | - | ✓ | - | - | - | - | - |
| 106 | Art & Craft | - | - | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | - | - | - |
| 107 | Interior Designing | - | - | - | - | - | - | ✓ | - | - | - | - | - | - |
| 108 | Fashion Designing | - | - | - | - | - | - | - | - | ✓ | - | - | - | ✓ |
| 109 | Art & Designing | - | - | ✓ | - | - | - | - | - | - | - | - | - | - |
| 110 | Landscaping | - | - | ✓ | - | ✓ | - | - | - | - | - | - | - | - |
| 111 | Applied Horticulural Studies | - | - | - | - | - | - | - | - | - | - | - | ✓ | - |
| 112 | Livestock Product Studies | - | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | - | - | ✓ | ✓ |
| 113 | Food Processing Studies | - | - | - | - | ✓ | - | - | - | ✓ | - | - | - | - |
| 114 | Electrical and Electronic Studies | - | - | - | - | - | - | ✓ | ✓ | - | - | - | ✓ | - |
| 115 | Aquatic Resource Studies | - | - | - | - | ✓ | - | - | - | - | - | - | - | - |
| 116 | Plantation Product Studies | - | - | - | - | - | - | - | - | - | - | - | - | ✓ |
| 117 | Construction Studies | - | - | - | - | ✓ | ✓ | - | ✓ | ✓ | - | ✓ | | ✓ |
| 118 | Automobile Studies | - | - | - | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ |
| 119 | Textile & Apparel Studies | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | ✓ |
| 120 | Metal Fabrication Studies | - | ✓ | ✓ | - | - | - | | ✓ | - | - | - | - | - |
| 121 | Aluminum Fabrication Studies | - | - | ✓ | - | - | - | ✓ | - | - | - | - | ✓ | - |
| 122 | Computer Hardware & Networking (Web Des & Software Development) | - | - | - | - | - | - | ✓ | ✓ | - | - | - | - | ✓ |
| 123 | Manufacturing | - | ✓ | ✓ | - | - | - | - | ✓ | ✓ | - | - | - | - |
| 124 | Tourism & Hospitality | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | - | ✓ | - |
| 125 | General Information Technology (GIT) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 126 | English | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 127 | Chemistry | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ |
| 128 | Physics | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 129 | Biology | ✓ | - | - | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | - |
| 130 | Agriculture Science | ✓ | - | ✓ | - | - | - | - | - | - | - | - | - | - |
| 131 | Combined Mathematics | - | - | ✓ | - | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | - | - | ✓ |

| SubNo | Subject | Ampara | | | | Batticaloa | | | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AKKARAIPATTU | KALMUNAI | SAMMANTHURAI | THIRUKKOVIL | BATTICALOA | BATTICALOA CENTRAL | BATTICALOA WEST | KALKUDAH | PADDIRUPPU | KANTHALE | KINNIYA | MUTHUR | TRINCOMALEE |
| 132 | Engineering Technology | - | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ |
| 133 | Bio-System Technology | - | ✓ | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ | - |
| 134 | Science for Technology | - | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ |
| 135 | Information & Communication Technology (ICT) | ✓ | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | - | ✓ |
| 136 | Accounting | - | - | - | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | - | - |
| 137 | Business Studies | - | - | - | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ |
| 138 | Economics | - | ✓ | - | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ |
| 139 | Geography | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 140 | Political Science | - | - | ✓ | - | - | - | - | - | - | ✓ | - | ✓ | - |
| 141 | History (Indian/Europe/Modern World) | - | ✓ | ✓ | - | ✓ | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | - |
| 142 | Logic & Scientific Method | - | - | - | - | - | - | - | ✓ | - | - | - | ✓ | - |
| 143 | Home Economy | - | - | ✓ | - | - | - | - | ✓ | ✓ | - | - | | - |
| 144 | Arabic | - | - | - | - | - | ✓ | - | - | - | - | - | - | - |
| 145 | Food and Technology | - | ✓ | - | - | - | - | - | - | - | - | - | - | - |
| 146 | Agro Tech | ✓ | ✓ | - | - | - | - | - | - | - | - | - | - | - |
| 147 | Communication & Media Studies | - | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | - |
| 148 | Christianity (N.R.C) | - | - | ✓ | - | ✓ | - | - | - | - | - | - | - | - |
| 149 | Christian Civilization | - | - | - | - | - | - | - | - | - | - | - | ✓ | - |
| 150 | Hindu Civilization | - | - | ✓ | - | - | - | ✓ | ✓ | ✓ | - | - | ✓ | ✓ |
| 151 | Islam | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | - | | ✓ | ✓ | ✓ | ✓ |
| 152 | Islam Civilization | - | - | - | - | - | ✓ | - | - | - | - | - | - | ✓ |
| 153 | Art | - | - | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | - | - |
| 154 | Dansing (Baratham) | - | ✓ | - | - | - | - | - | ✓ | - | - | - | - | - |
| 155 | Music (Carnatic) | - | ✓ | - | - | - | - | - | ✓ | - | - | - | ✓ | - |
| 156 | Drama & Theatre | - | ✓ | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | - | - | ✓ | - |
| 157 | Tamil (Language) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - |

# Vacancies of Secondary in Eastern Province (Tamil Medium)

| Sub No | Subject | Ampara | | | | Batticaloa | | | | | Trincomalee | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AKKARAIPATTU | KALMUNAI | SAMMANTHURAI | THIRUKKOVIL | BATTICALOA | BATTICALOA CENTRAL | BATTICALOA WEST | KALKUDAH | PADDIRUPPU | KANTHALE | KINNIYA | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 158 | Guidance & Counselling | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - |
| 159 | Special Education Unit | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | - | ✓ | - |
| 160 | Science | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - |
| 161 | Maths | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 162 | Tamil | - | ✓ | - | - | - | ✓ | ✓ | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 163 | Islam | - | - | - | - | - | - | - | - | - | - | - | - | ✓ | - |
| 164 | English | - | - | - | - | - | - | ✓ | ✓ | - | - | ✓ | - | - | - |
| 165 | History | - | - | ✓ | - | ✓ | - | ✓ | - | - | - | - | - | ✓ | ✓ |
| 166 | Saivam | - | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |
| 167 | (Religion Subjects)Roman Catholic | - | - | ✓ | - | - | - | ✓ | ✓ | ✓ | - | - | - | ✓ | - |
| 168 | (Religion Subjects)Non Roman Catholic | - | ✓ | - | ✓ | - | - | ✓ | ✓ | ✓ | - | - | - | ✓ | - |
| 169 | Geography | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 170 | Civic Education | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 171 | Business & Accounting Studies | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |
| 172 | Entrepreneurship Education | ✓ | ✓ | - | - | ✓ | - | - | ✓ | - | - | ✓ | - | - | - |
| 173 | Arabic | - | - | - | - | - | - | - | - | - | - | ✓ | - | ✓ | - |
| 174 | Second Language (Sinhala) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 175 | Music (Carnatic) | - | - | - | - | ✓ | - | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | - | ✓ |
| 176 | Art | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 177 | Literature (Arabic) | - | ✓ | - | - | - | ✓ | - | - | - | - | ✓ | ✓ | ✓ | - |
| 178 | Dancing (Baratham) | - | - | - | - | ✓ | - | ✓ | - | ✓ | - | - | ✓ | - | - |
| 179 | Drama & Theatre | - | - | - | - | ✓ | - | ✓ | ✓ | ✓ | - | - | - | ✓ | ✓ |
| 180 | Literature (Tamil) | ✓ | ✓ | ✓ | - | - | ✓ | - | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | - |
| 181 | Information & Communication Technology (ICT) | ✓ | ✓ | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 182 | Agriculture & Food Technology | - | ✓ | - | - | ✓ | - | - | - | ✓ | - | - | - | ✓ | - |
| 183 | Aquatic Bioresource Technology | - | - | - | - | ✓ | - | - | - | - | - | - | - | - | - |
| 184 | Art & Crafts | - | - | - | - | - | - | - | ✓ | - | - | - | - | - | - |
| 185 | Communication & Media Studies | ✓ | ✓ | - | - | ✓ | - | ✓ | ✓ | ✓ | - | ✓ | - | ✓ | - |
| 186 | Home Economics | - | - | - | - | ✓ | - | - | - | ✓ | ✓ | - | - | - | - |
| 187 | Practical & Technical skills (PTS) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | - | ✓ | ✓ | - |

| Sub No | Subject | Ampara | | | | Batticaloa | | | | | Trincomalee | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AKKARAIPATTU | KALMUNAI | SAMMANTHURAI | THIRUKKOVIL | BATTICALOA | BATTICALOA CENTRAL | BATTICALOA WEST | KALKUDAH | PADDIRUPPU | KANTHALE | KINNIYA | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 188 | Design & Construction Technology | - | - | - | ✓ | - | - | - | ✓ | - | - | - | - | ✓ | - |
| 189 | Health & Physical Education | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | ✓ | ✓ | ✓ | ✓ |

## Vacancies of Secondary in Eastern Province (Bi-Lingual)- Sinhala

| S.No | Subject | Ampara | | | Trincomalee | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | AMPARA | Mahaoya | DEHIATTAKANDIYA | KANTHALE | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 201 | Science | ✓ | - | ✓ | - | - | - | - |
| 202 | Maths | ✓ | - | ✓ | - | - | - | - |
| 203 | Geography | - | - | - | - | - | - | - |
| 204 | Civic | ✓ | - | ✓ | - | - | - | - |
| 205 | Business & Accounting | - | - | - | - | - | - | - |
| 206 | ICT | - | - | ✓ | - | - | - | - |
| 207 | Communication & Media Studies | - | - | - | - | - | - | - |
| 208 | Health & Physical Education | - | - | ✓ | - | - | - | - |

## Vacancies of Secondary in Eastern Province (Bi-Lingual) - Tamil

| S.No | Subject | Ampara | | | Batticaloa | | | | | Trincomalee | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | AKKARAIPATTU | KALMUNAI | THIRUKKOVIL | BATTICALOA | BATTICALOA CENTRAL | BATTICALOA WEST | KALKUDAH | PADDIRUPPU | KANTHALE | KINNIYA | MUTHUR | TRINCOMALEE | TRINCOMALEE NORTH |
| 301 | Science | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | - | ✓ | - | ✓ | - |
| 302 | Maths | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | - | ✓ | - | ✓ | - |
| 303 | Geography | ✓ | ✓ | ✓ | ✓ | - | - | - | - | - | ✓ | - | - | - |
| 304 | Civic | ✓ | ✓ | ✓ | - | - | - | - | - | - | - | - | - | - |
| 305 | Business & Accounting | ✓ | | | - | - | - | - | - | - | - | - | - | - |
| 306 | ICT | ✓ | ✓ | ✓ | - | ✓ | - | - | - | - | ✓ | - | ✓ | - |
| 307 | Communication & Media Studies | - | ✓ | - | - | - | - | - | - | - | - | - | - | - |
| 308 | Health & Physical Education | ✓ | - | ✓ | ✓ | - | - | - | - | - | ✓ | - | - | - |

සටහන : '✓' ලකුණ පුරප්පාඩු පවතී යන්නත්, '-' ලකුණ පුරප්පාඩු නොමැත යන්නත් අර්ථවත් වේ.

**EX/Rec/22/02**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගත් උපාධිධාරීන් නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම- 2022**

**ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය** : ............................................................. **දිස්ත්‍රික්කය තුළ පදිංචි කාලසීමාව(අවුරුදු)** : .......................

ඉල්ලුම් කරනු ලබන විෂයය : (උපලේඛන 01,02 අනුව යොදන්න)

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |

අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක : 1. ................................................
2. ................................................

**1.0** 1.1 මුලකුරු සමග නම : Rev/Mr/Mrs/Miss ...................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

1.3 සම්පූර්ණ නම : ........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ........................................................................................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ........................................................................................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

2.2 ස්ථිර ලිපිනය : ........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ........................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

**3.0** 3.1 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 **2019.12.31** දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ජනවර්ගය : සිංහල ☐ ශ්‍රී ලාංකික දෙමළ ☐ මුස්ලිම් ☐ වෙනත් ☐
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ............................................
(ii) විභාග අංකය : ............................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.3 උපාධිය පිළිබඳ විස්තර

5.3.1 උපාධිය : ..............................................................................................................................

5.3.2 විශ්ව විද්‍යාලය/ ආයතනයේ නම: ..............................................................................................

5.3.3 උපාධිය වලංගු වන දිනය: ......................................................................................................

5.3.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන්: ...........................................................................

5.3.5 උපාධි වර්ගය : අභ්‍යන්තර ( ) බාහිර ( ) *(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

5.4 ඩිප්ලෝමාව පිළිබඳ විස්තර

5.4.1 ඩිප්ලෝමාව : ..........................................................................................................................

5.4.2 ආයතනයේ නම: ........................................................................................................................

5.4.3 ඩිප්ලෝමාව වලංගු වන දිනය: ..................................................................................................

5.4.4 ඩිප්ලෝමා කාල සීමාව : ..........................................................................................................

**6.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය පිළිබඳ විස්තර

6.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : ..........................................................................

6.2 වර්තමාන තනතුර : ..........................................................................

6.3 තනතුරෙහි ස්ථිර කළ දිනය : ..........................................................................

6.4 මුල්පත්වීම් දිනය : ..........................................................................

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ..........................................................................................................................................

**8.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....................................

............................................

අයදුම්කරුගේ අත්සන

**9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 3.5 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

දිනය : ..................................

..........................................................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: .........................................................................

තනතුර : ...............................................................................

ලිපිනය : ...............................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**10.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් .................................. තනතුරෙහි සේවය කරන ................................................. මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය තම සේවා කාලය තුළ කිසිදු විනයානුකූල කටයුත්තකට භාජනය නොවූ බවත්, සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මෙහි ඔහු/ඇය විසින් සඳහන් කර ඇති විස්තර ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

දිනය : ...............................

.......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ...............................................................................

පදවි නාමය : ...............................................................................

ලිපිනය : ...............................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)